**වවුනියා දිස්ත්‍රික්කය ගොවිජන සේවා කාරක සභා 09 - 2023**

**------------------------------------------------------------------**

**1. විගණන මතය**

**1.1** වවුනියා දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා නවයක 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** වවුනියා දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 09 ට අදාළව 2023 වර්ෂයේ නිකුත් කර තිබුණ විගණන වාර්තා 09 ක් තිබූ අතර තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබූ අතර ඒ සඳහා හේතු වී තිබූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 03කට අයත් එකතුව රු.6,925,295ක් වටිනාකම වූ පොහොර ගබඩා ගොඩනැගිලි සහ වී වේලීමේ පරිශ්‍ර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | පොහොර ගබඩා ගොඩනැගිලි තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කරනු ලබන අතර වී වේලීමේ පරිශ්‍රයේ වටිනාකම 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරනු ලබන බව. | ස්ථාවර වත්කම්වල නිවැරදි වටිනාකම ගිණුම්ගත කළයුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 03ක් විසින් සමාලොචිත වර්ෂයේ පරිත්‍යාග ලෙස ලැබූ රු. 1,165,250ක වත්කම් ඒකක 14ක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | පරිත්‍යාග වශයෙන් ලද වත්කම් 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරනු ලබන බව. | පරිත්‍යාග ලැබූ වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට පියවර ගතයුතුය. |
| (ඇ) | ගුරුක්කල් පුදුක්කුලම් ගොවිජන සේවා කාරක සභාව විසින් ට්‍රැක්ටරය 2022 වර්ෂයේ රු. 1,249,456 ක් වැයකර අළුත්වැඩියා කර තිබූ අතර එහි අගය ප්‍රාග්ධනිත නොකර වත්කමේ අගය රු.169,266ක් ලෙසට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හෙළිදරව් කර තිබුණි. | 2024 ගිණුම්වල නිැවැරදි කිරීමට පියවර ගනු ලබන බව. | ස්ථාවර වත්කම්වල නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සෙට්ටිකුලම් ගොවිජන සේවා කාරක සභාවේ ගොඩනැගිලි සහ යන්ත්‍රෝපකරණ සඳහා පිළිවෙලින් සියයට 05ක් සහ සියයට 20ක සරල මාර්ග ක්‍රමයට ක්ෂය ගණනය කළයුතු | චක්‍රලේඛ ප්‍රකාරව පියවර ගනු ලබන බව කාරුණිකව දැනුම් දී ඇති බවට. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාමාර්ග ගතයුතුය |

වුවත්, හීනවන ක්ෂය ක්‍රමයට ක්ෂය ගණනය කර තිබුණි.

### 1.3.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම්

| | විෂයය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 09ක සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු මුදල් සහ ගෙවිය යුතු මුදල් ශේෂ එකතුව රු. 21,533,397ක් ඉදිරිපත් කර තිබූ නමුත් ඒවා සනාථ කිරිමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට නොලැබීම හේතුවෙන් සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය. | ගිණුම්වලට අදාල තහවුරු කිරිමේ ලිපිලේඛන විනාශ වී ඇති බැවින් මෙම ශේෂ ඉවත් කිරිමට කොමසාරිස් ජනරාල් වරයාගේ අනුමැතිය සඳහා යවා ඇති බව. | අදාළ ගිණුම් ශේෂ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් කර සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | පම්බෙයිමඩු ගොවිජන සේවා කාරක සභාවේ මූල්‍ය ප්‍රකාශවල දක්වා ඇති රු.8,133,436ක ස්ථාවර තැන්පතු දෙකකට අදාළ ස්ථාවර තැන්පතු සහතික විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | යුද සමයේ ස්ථාවර තැන්පතු සහතික පත්‍ර අස්ථානගත වී ඇත. බැංකුවට වාර්තා කර නව සහතික පත්‍ර ලබාගැනීමට කටයුතු කරන බව. | ස්ථාවර තැන්පතු සහතික පත්‍ර ලබාගෙන විගණනයට ඉදිරිපත් කළයුතුය. |

### 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| නීතී, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2020 ජුනි 25 දිනැති අංක 08/2020 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වරයාගේ චක්‍රලේඛය | ගොවිජන සේවා කාරක සභා 08ක නිලධාරීන්ගෙන් අයකර ගතයුතු ඇප මුදල් රු.160,000ක් අයකර නොතිබුණි. | ඇප මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 09ක මෙහෙයුම් ප්‍රතිඵලවලින් රු. 3,260,796 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,296,467 ක් විය ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලවල රු. 5,557,263 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සෙට්ටිකුලම් ගොවිජන සේවා කාරක සභාවේ ට්‍රැක්ටරයට අදාල හිඟ කුලී රු.115,000ක් පසුගිය වර්ෂ 02ක සිට අයකර නොතිබූ අතර 2022 ජූලි | මෙම කරුණ සමථ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී. | හිඟමුදල් නියමිත කාල වකවානු තුළ ගිවිසුම්ගත අයකර ගැනීමටත් |

| | | | |
|---|---|---|---|
| | 21 දිනෙන් පසු ගිවිසුම් අළුත් කිරීමද සිදු කර නොතිබුණි. ගිවිසුම් අළුත් නොකළ කාලපරිච්ඡේදයට අදාල හිඟකුලී රු.240,000ක් ද අයවිය යුතුව පැවතුණි. | නොවූ කාලපරිච්ඡේදයට අදාල කුලී ගෙවන ලෙසට අදාල පුද්ගලයාට දන්වා ඇති බව. | ගිවිසුම් කාලය දීර්ඝ කිරීමටත් පියවර ගතයුතුය. |
| (ආ) | සෙට්ටිකුලම් ගොවිජන සේවා කාරක සභාව සහ ගොවීන් අතර 2021 ජූලි 21 දින සිදුකර ගත් ගිවිසුමේ කොන්දේසි අංක 10 ප්‍රකාරව, ගිවිසුම් කාලය අවසන් වූ පසු කුලියට ලබා ගත් ට්‍රැක්ටරය තබා ගන්නා සෑම දිනයක් සඳහාම දිනකට රු.2,000 බැගින් වන අමතර ගාස්තුවක් අයකළ යුතුවේ. එසේ වුවත්, ගිවිසුම් අවසන් වී දින 502ක් ඉකුත්වී තිබූ නමුත් අමතර ගාස්තු රු.1,004,000ක් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම කරුණ සමථ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතින බව. | ගිවිසුම් පකාරව අමතර ගාස්තු නියමිත කාල වකවානු තුළ අයකර ගැනීමටත් පියවර ගතයුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 07ක් විසින් වැව්වල සීමාවන් සලකුණු කිරීම සඳහා මිලදීගෙන තිබූ රු. 2,019,735ක් වටිනා මායිම් ගල් 2,684ක් අදාල අරමුණු සඳහා සඳහා භාවිතා නොකර පසුගිය වර්ෂ 03 සිට 07කට අධික කාලයක් ගබඩාවේ රඳවා ගෙන තිබුණි. | අළුත් වර්ගයේ මායිම් ගල් හඳුන්වා දීම මගින් පැරණි වර්ගයේ මායිම් ගල් ඒ අතරතුර භාවිතා කිරීමට පියවර ගනු ලබන බව. | වැව්වල සීමා ලකුණු කිරීම සඳහා මායිම් ගල් භාවිතා කර අදාළ කාර්යය නිම කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 04ක් සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් රු. 818,485ක් වැයකර සැකසූ කාබනික පොහොර ප්‍රතිලාභීන්ට ලබා දීමෙන් තොරව මධ්‍යස්ථානයේ රඳවා තබා ගෙන තිබුණි. | රජයේ ප්‍රතිපත්තිවලට අනුව රසායනික පොහොර අනුමත කළ නිසා, ගොවීන්ගෙන් මේ සඳහා වූ ඉල්ලුම අඩුවී පැවැතුණි.වර්තමානයේ ගොවීන්ගේ ඉල්ලීමට අනුව විකිණීම සිදුකරන අතර මධ්‍යස්ථානයේ භාවිතා කිරීමටත් පියවර ගනු ලබන බව. | පොහොර සකස් කළ අරමුණු සඳහා භාවිතා කිරීමට ක්‍රියාමාර්ග ගතයුතුය. |

## 3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 09ක් විසින් ණයගැතියන්ගෙන් අයකළ යුතු රු. 10,973,032ක් පසුගිය වර්ෂ 01 සිට 12ක් දක්වා කාලයක් තුළ අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | දීර්ඝකාලයක සිට නිරවුල් නොකළ ලැබිය යුතු මුදල් පොත්වලින් කපාහැරීමට සහ ඉතිරි ඒවා අයකර ගැනීමටත් උපදෙස් ලබාදී ඇති බව. | ලැබිය යුතු මුදල් නියමිත කාලය තුළ අයකර ගැනීමට පියවර ගතයුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 08ක් විසින් ගොවීන් 72කට ලබාදුන් ට්‍රැක්ටර් වෙනුවෙන් අයවිය යුතු හිඟණය රු.10,007,184ක් පසුගිය වර්ෂ 10 සිට 12ක් දක්වා කාලයක් තුළ අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | ගොවිජන සේවා මධ්‍යස්ථානය විසින් ණය ලෙස ලබාදුන් රෝද දෙකේ ට්‍රැක්ටර් ණය අයකර ගැනීමට ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව. | හිඟණය මුදල් නියමිත කාලය තුළ අයකර ගැනීමට පියවර ගතයුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 07කට ගෙවීම් කළයුතු රු.7,942,589ක් පසුගිය වර්ෂ 01 සිට 13කට අධික කාලයක් තුළ | දීර්ඝකාලයක සිට නිරවුල් නොකළ ගෙවිය යුතු මුදල් පොත්වලින් කපාහැරීමට සහ 2017 සිට 2023 | ගෙවිය යුතු මුදල් කාලය තුළ ගෙවීම් කිරීමට පියවර ගතයුතුය. |

| | | |
|---|---|---|
| නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | දක්වා වූ මුදල් අදාල පුද්ගලයින්ට ගෙවීමට කටයුතු කරමින් පවතින බව. | |

**3.4 මතභේදාත්මක ස්වරූපයේ ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සෙට්ටිකුලම් ගොවිජන සේවා කාරක සභාව විසින් සහනාධාර ලෙස ලබා දුන් පොහොර වෙනුවෙන් අයකර තිබූ රු.513,580ක් ප්‍රතිලාභීන්ට ආපසු නොගෙවා දීර්ඝ කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල බැරකම් ලෙස දක්වා තිබුණි. | අදාල ගොවීන්ගේ විස්තර නිවැරදිව යාවත්කාලීන නොකිරීම නිසා ආපසු ගෙවිය නොහැකිව පවතින අතර දීර්ඝ කාලයක සිට නිරවුල් නොකළ ගෙවිය යුතු මුදල් පොත්වලින් කපා හැරීමට කටයුතු කරමින් පවතින බව. | අදාල මුදල් ප්‍රතිලාභීන්ට ආපසු ගෙවීම් කිරීමට හෝ විධිමත් අනුමැතියක් යටතේ ආදායමට ගැනීමට පියවර ගතයුතුය. |

**3.5 වාහන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු. 7,039,193ක් වැයකර අළුත්වැඩියා කළ ට්‍රැක්ටර් 07ක් 2022 අගෝස්තු 16 දින ගොවිජන සේවා කාරක සභා 05කට භාරදී තිබූ නමුත් ඒවා භාවිතා කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | තවදුරටත් අළුත්වැඩියා කළයුතු තත්ත්වයේ පවතී. අළුත්වැඩියා සිදුකර සී සෑමේ කටයුතුවලට පරිහරණය කිරීමට කටයුතු කරනු ලබන බව. | ට්‍රැක්ටර් භාවිතා කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් යෙදීමට ක්‍රියාමාර්ග ගතයුතුය. |

**3.6 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කනගරායන් කුලම් ගොවිජන සේවා කාරක සභාව සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2011 වර්ෂයේ රු.මිලියන 1.5ක් වැයකර ඉදිකළ පොහොර ගබඩාව 2018 වර්ෂයේ සිට අභාවිත තත්ත්වයෙන් පැවැතුණු බව නිරීක්ෂණය විය. | එම පොහොර ගබඩාව වෙනත් අවශ්‍යතාවක් සඳහා ප්‍රයෝජනවත් අයුරින් භාවිතා කිරීමට ප්‍රයත්න දරමින් සිටින බව. | පොහොර ගබඩාව භාවිතා කිරීමට ක්‍රියාමාර්ග ගතයුතුය. |

**4.** **ගොවිජන බැංකු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන කාරක සභා 07ක ප්‍රතිලාභීන්ට ලබාදුන් බීජ ණය, ලබාදුන් දින සිට මාස 06ක් ඇතුළත අයකර ගත යුතු බව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ සඳහන් වී තිබුණද, ගොවිජන බැංකු විසින් ලබා දුන් එකතුව රු.21,844,327 ක ණය මුදලක් වර්ෂ 01 සිට 14කට අධික කාලයක් ප්‍රතිලාභීන්ගෙන් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | ප්‍රතිලාභීන් 28කගේ ගොනු ගොවිජන සමථ මණ්ඩල මගින් අයකර ගැනීමටත් පියවර ගෙන ඇත. ඉතිරි ණය මුදල් ඊළඟ මූල්‍ය වර්ෂයේ අයකර ගැනීමට ඉදිරි පියවර ගනු ලබන බව. | චක්‍රලේඛය ප්‍රකාරව පියවර ගතයුතුය. |